**ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 14 දින අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 39.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 30.80 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 8.60 ක් හෙවත් සියයට 21.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 37.16 | 28.65 | 8.51 | 22.90 |
| මූලධන | 2.24 | 2.15 | 0.09 | 4.02 |
| **එකතුව** | **39.40** | **30.80** | **8.60** | **21.83** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 2.00 | 1.86 | 0.30 | 0.80 | 8.00 | 3.79 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0429/0016/000 දරණ අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.06 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 විසර්ජන ගිණුම

----------------

2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.4 වගන්තිය ප්‍රකාර බැදීම් ඇතිකර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතුය. එසේ වුවද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබියදී වැය විෂයයන් 03 ක් වෙනුවෙන් ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා රු. 246,686 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 3.2 කාර්යසාධනය

---------------

2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ අමාත්‍යාංශ පරිශ්‍රය තුළ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය සඳහා LAN (Local Area Network) පද්ධතියක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කළද, සමාලෝචිත වර්ෂය තුළදී එවැනි පද්ධතියක් සංවර්ධනය කර නොතිබුණි.

(ආ) ආදායම් උපයන දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය තත්කාලීනව ඒකාබද්ධ කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 02 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 03 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 19 | 13 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 05 | 03 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 02 | 00 |
| | **එකතුව** | **45** | **25** | **20** |

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක් ඇතුළුව තනතුරු 20 ක් පුරප්පාඩුව පැවැති අතර ඒවා පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩල තනතුරු වලට පරිබාහිරව ප්‍රචාරක සහකාර නිලධාරී, වැඩසටහන් සහකාර සහ විද්‍යා හා තාක්ෂණ නිලධාරී යන තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ තනතුරු අනුමත කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතුකර නොතිබුණි.

(ඇ) විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ බඳවාගෙන ඇති ප්‍රචාරක සහකාර නිලධාරී හා විද්‍යා තාක්ෂණ නිලධාරි යන තනතුරුවල සේවයේ නියුතුව සිටි නිලධාරීන් දෙදෙනෙක් පසුව සංවර්ධන නිලධාරී තනතුරු වලට අන්තර්ග්‍රහනය කිරීමේ පදනම මත තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම නිලධාරීන් එකී තනතුරුවලට අන්තර්ග්‍රහනය කිරීමට කටයුතු කර නොතිබුණි.